# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2130/3 - 2019 ජූලි මස 01 වැනි සඳුදා - 2019.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 06/03/1/519.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිල්ලෑව, කිදෙල්පිටිය හා ගොරොක්ගොඩ ගම්වල පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක කා. 4726 හි ප්‍රමාණයෙන් හෙක්. 46.9762 ක් පමණ වූ පහත විස්තර සඳහන් කොටස්වල මායිම්, මූලික පිඹුරු අංක 4726 හි කැබලි අංක 1 සිට 9 දක්වා

01. කැබලි අංක 1

ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: රබර් වගාව අවු. 5 - 20 පමණ වයසැති; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1 ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 21.1656.

02. කැබලි අංක 2

ඉඩමේ නම: --; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.4761.

03. කැබලි අංක 3

ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: අවු. 5 - 10 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1 ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 0.7259.

04. කැබලි අංක 4

ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: අවු. 5 - 10 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1, ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 0.0119.

1A - G 30421 - 37 (2019/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05. **කැබලි අංක 5**
ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: අවු. 5 - 10 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1, ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 0.2454.

06. **කැබලි අංක 6**
ඉඩමේ නම: නාකන්දලහේන; ඉඩමේ විස්තරය: අවු. 5 - 10 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: අශෝක සුමේධ අමරසේකර සහ අනිල් අමරසේකර; ප්‍රමාණය: හෙක්. 0.5804.

07. **කැබලි අංක 7**
ඉඩමේ නම: නාකන්දලහේන; ඉඩමේ විස්තරය: අවු. 5 - 10 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: අශෝක සුමේධ අමරසේකර සහ අනිල් අමරසේකර; ප්‍රමාණය: හෙක්. 0.1454.

08. **කැබලි අංක 8**
ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: අවු. 15 - 30 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1, ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 23.2680.

09. **කැබලි අංක 9**
ඉඩමේ නම: තෙරුගල සහ කුරුඳුවත්ත; ඉඩමේ විස්තරය: අවු. 15 - 30 පමණ වයසැති රබර් වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කොටගල වැවිලි සමාගම, 53 1/1, ශ්‍රීමත් බාරොන් ජලතිලක මාවත, කොළඹ 01; ප්‍රමාණය: හෙක්. 0.3575.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් කියන අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.09.04 වැනි දින පෙ. ව. 10.00ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019.08.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබද විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ඒ. කමල් පුෂ්පකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2019 මැයි මස 25 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-476

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. ගොනු අංකය* : BLDS/LND/7/2/4/122.
*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය* : 4-3/15/2017/VE/381.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවේ විස්තරය:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 265සී, විජනත්කුඹුර ග්‍රාම නිලධාරි වසමේ විජනත්කුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620266 කලාප 02 න් 02 වැනි කලාපයේ පත්‍ර අංක 2 හි සඳහන් ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8086 ක් වූ පහත උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 02.

01. **කැබලි අංක 309**
ඉඩමේ නම: වලවේවත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.7690.

02. **කැබලි අංක 310**
ඉඩමේ නම: වලවේවත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0396.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.07.24 වැනි දින පෙ.ව. 10.00ට බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019.07.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබද විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එම්. එච්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
බලන්ගොඩ.

2019 ජූනි මස 26 වැනි දින,
බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-477

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : නුඑ/3/1/2/අත්පත්/32.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03/J/88/D/13.

අංක 1144/15 හා 2000.08.10 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* III කොටසේ 3ඒ පිටුවේ පළ කරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් කැබලි අංක 01 සඳහා අවසාන පරිච්ඡේද 2 පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

''ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් අයවලුන් හෝ 2019 අගෝස්තු මස 05 දින පෙ.ව. 10.00ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2019 ජූලි මස 25 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර කර වන්දි මුදල හා ඒ වන්දි මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.''

ඩබ්ලිව්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2019 ජුනි මස 26 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-478

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.